# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2250/44 - 2021 ඔක්තෝබර් මස 22 වැනි සිකුරාදා - 2021.10.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ පලාගල ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන පලාගල ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ පලාගල ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ සාලිය නිශ්ශංක කුමාරගේ මදූෂා විරාජිනී නිශ්ශංක අයත් වන්නා වූ එක්සත් ජාතික පක්ෂය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම පලාගල ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වත්තේගම ගෙදර ප්‍රියංගිකා ලලිත් විජේවීර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

පලාගල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී, කෙංගාදරන් මුගුන්දන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් වත්තේගම ගෙදර ප්‍රියංගිකා ලලිත් විජේවීර, පලාගල ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

කේ. මුගුන්දන්,
තේරීම්භාර නිලධාරී,
පලාගල ප්‍රාදේශීය සභාව.

2021 ඔක්තෝබර් මස 21 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අනුරාධපුර.

11 - 94

1A - G 35170 — 30 (2021/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*